**ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 135 - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එම සමාගම් 10කින් රජයට අයවිය යුතු රු.587,146,771ක බදු ආදායම හිඟව පැවතියද , මු.රෙ.176(2) ප්‍රකාරව භාණ්ඩාගාරය හා එක්ව අප්‍රමාදව හිඟ හිටි ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැවිලි සමාගම් 08 ක් විසින් 2023.12.31 දිනට හිඟහිටි බදු මුදල 2024.04.30 දින වනවිට සම්පූර්ණයෙන් ගෙවා අවසන් කර ඇති අතර, කොටගල වැවිලි සමාගම වාරික 2 ක් හා කුරුණෑගල වැවිලි සමාගම විසින් ද හිඟ බදු මුදලින් එක් කාර්තුවක් ගෙවා ඇත 2024.04.30.දිනට හිඟ බදු මුදල රු.642,476,963 කි. කොටගල වැවිලි සමාගම හා කුරුණෑගල වැවිලි සමාගම් දෙක විසින් ගෙවිය යුතු හිඟ බදු කුලිය නිසා එම හිඟ බදු කුලිය වර්ධනය වීමට හේතු වී ඇත. | හිඟ බදු හා වාර්ෂික බදු ආදායම් නියමිත පරිදි අයකර ගැනීමට විධිමත් පියවර ගත යුතුය. |
| (ආ) | 1995 වර්ෂයේ නොවැම්බර් 27 දින කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකරගත් අංක 1558 දරන කල් බදුකුලී සංශෝධිත ගිවිසුම අනුව එදිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණය මත ගණනය කළ බදු මුදල වසර 53 ක් තුළ වසරකදී සමාන වාරික හතරකින් ගෙවිය යුතු වුවද ශුද්ධ වත්කම් අඩුවීම මත සමාගම විසින් වසරකට ගෙවිය යුතු බදු මුදල අඩුවෙන් ගෙවීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට රු.326,507,724 ක් කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතු අතර ඉන් රු.168,290,244 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පැවත තිබුණු බව නිරීක්ෂණය විය. බදු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් කල් බදු සංශෝධන ගිවිසුමෙහි 2(a) සහ 5(c) ඡේද අනුව ද කටයුතු කර නොතිබුණි. | කුරුණෑගල වැවිලි සමාගම විසින් ඔවුන් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය යටතේ අඛණ්ඩව බදු කුලිය ගෙවීම් කර ඇත. නමුත් එම සමාගමේ හිඟ බදු කුලිය වර්ධනය වී ඇත්තේ සමාගම හා ස්වර්ණමය භිමිකරු ගණනය කරනු ලබන ක්‍රමවේදය අතර පවතින වටිනාකම් වල වෙනස මඟිනි. කුරුණෑගල වැවිලි සමාගම 100% ක් රජය සතු වැවිලි සමාගමක් වන බැවින් හිඟ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ද වැඩිදුරටත් තීරණය විය. මේ සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් නිලධාරීන් සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව දන්වා ඇත. | ගිවිසුම පරිදි බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු අතර බදු ගිවිසුමේ අනෙකුත් කොන්දේසි පරීක්ෂා කර හා සමාලෝචනය කර එකඟ වූ බදු මුදල් නොගෙවීම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 පෙබරවාරි 15 දින අංක PE/PL/RP/Gen/2017 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව වැව්ලි සමාගම් විසින් රජයේ ඉඩම් උප බදුදීම් තුළින් උපයන කුලී ආදායමෙන් සියයට 20 ක ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට කාර්තුමය පදනමින් අය කිරීමට නියම කර තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.39,068,269ක මුදලින් සමාලෝචිත වර්ෂයේදී රු.19,145,371ක් පමණක් ලැබී තිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට මුළු හිඟහිටි උප බදු මුදල රු.19,922,898ක් විය. 2023 වර්ෂය සඳහා වැව්ලි සමාගම් 10කින් උප බදු කිසිවක් අයවී නොතිබුණි. | 2023.12.31 දිනට හිඟ උප බදු කුලී මුදල අයකර ගැනීම සඳහා අදාළ වැව්ලි සමාගම් වෙත ලිඛිතව දැනුම් දී ඇත | වැව්ලි සමාගම් විසින් රජයේ ඉඩම් උපබදුදීම් තුළින් උපයන කුලී ආදායමෙන් සියයට 20ක ගාස්තුවක් ඒකාබද්ධ අරමුදලට කාර්තුමය පදනමින් ගෙවීමට විධිමත් පියවරක් නොපමාව ගත යුතුය. |

**2.2 වියදම් කළමනාකරණය**

**2.2.1 ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා**

| | **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදනයන් පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ.66 මගින් වැය විෂයයන් 04 ක ප්‍රතිපාදන සියයට 33 සිට සියයට 305 දක්වා ප්‍රතිශතයකින් මාරු කර තිබුණි. | 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී 135-1-1-0-1003 සහ 135-1-1-0-1101 සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ඉල්ලුම් කළද ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් මු.රෙ.66 යටතේ එම වැය විෂයන් දෙක සඳහා රු.මි.3.8 ක ප්‍රතිපාදන මාරු කර ගන්නා ලද අතර 135-2-3-11-2202 වැය විෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් රු.මි.410.32 ක අතිරේක ප්‍රතිපාදනයක් ලබා දුනි.<br>135-2-4-21-1509 රු. මිලියන 1 මු.රෙ.66 මාරු කිරීම් වලින් ලද ප්‍රතිපාදනයකි. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කිරීමටද වෙන්කළ ප්‍රතිපාදන අදාළ කාර්යයේ ඵලදායි ලෙස යෙදවීමටද කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02ක් සඳහා සලසා තිබුණු එකතුව රු.2,500,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් | 2023 නොවැම්බර් මස සිට වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය, කෘෂිකර්ම හා වැව්ලි කර්මාන්ත වශයෙන් විෂයපථය සංශෝධනය වීම හේතුවෙන් අමාත්‍යවරයාගේ වියදම් පැන නොනැගීම හා අයවැය | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කිරීමටද වෙන්කළ ප්‍රතිපාදන අදාළ කාර්යයේ ඵලදායි ලෙස යෙදවීමටද කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | 21 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.292,500,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.127,014,153 ක් හෙවත් සියයට 29 සිට සියයට 97 දක්වා ඉතිරි වී තිබුණි. | චක්‍රලේඛ 01/2023 අනුව රාජ්‍ය වියදම් කළමණාකරණය කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.5,900,000 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර ප්‍රාග්ධන වැය විෂයයන් 07ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 4,074,120,000ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.2,751,915,094ක් එනම් සියයට 21 සිට සියයට 91 දක්වා ඉතිරි වී තිබුණි. | අයවැය චක්‍රලේඛ 01/2023 අනුව රාජ්‍ය වියදම් කළමණාකරණය කිරීම හා කාර්යාලීය අවශ්‍යතා මිලදී ගැනීම් සීමා කිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයන් වල ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කිරීමටද වෙන්කළ ප්‍රතිපාදන අදාළ කාර්යයේ ඵලදායි ලෙස යෙදවීමටද කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා මු .රෙ.66 යටතේ මාරුකර තිබුණු එකතුව රු.2,000,000ක ප්‍රතිපාදනවලින් එකතුව රු.1,568,080ක් අදාල කාර්යයන්හි උපයෝජනය නොකර නිශ්කාර්යව පැවතුණි. | පුරෝකථනය කළ ආකාරයට වියදම් පැන නොනැගීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කිරීමටද මු.රෙ. 66 යටතේ මාරු කළ ප්‍රතිපාදන අදාළ කාර්යයන්හි ඵලදායි ලෙස යෙදවීමටද කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති රීති රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත | ඉදිරියේදී අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරනු ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව භාවිතා කරන සියලුම වාහනවල ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂා කළ යුතුය. |

ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් භාවිතා කරන වාහන 55ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු පොල් ත්‍රිකෝණයේ පොල් පැළ බෙදා හැරීමේ ව්‍යාපෘතියට අදාළ ඉඩම් තෝරා ගැනීම,පොල් පැල බෙදාහැරීම හා පොල් පැල රෝපණය සඳහා රු.මිලියන 9.5ක් වෙන්කර තිබුණු අතර එම සම්පූර්ණ මුදලම වැය කර තිබුණද ඉඩම් තෝරාගැනීමේ භෞතික ප්‍රගතිය සියයට 44ක් වී තිබුණි. එසේම පොල් පැල රෝපණයේ ප්‍රගතියද සියයට 67 ක් වී තිබුණි. | 2023 වර්ෂයේ උතුරු පොල් ත්‍රිකෝණයේ සමස්ථ පැළ ඉලක්කය වන පොල් පැළ 700,480ක ප්‍රමාණය රු.මි.9.5ක ප්‍රතිපාදන යටතේ ප්‍රවාහනය කිරීම කිසිසේත් සිදුකළ නොහැක. එම මුදල යටතේ ප්‍රවාහනය කළ හැකිවනුයේ පැළ 173,000 පමණ වේ. එහෙත් එම විශේෂ ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී අතපසුවීමකින් පැළ ඉලක්කය ලෙස සඳහන් කර උතුරු පොල් ත්‍රිකෝණයේ 2023 වර්ෂයේ සිටුවනු ලබන සමස්ථ පැළ ඉලක්කය වේ. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 100% වුවද භෞතික ප්‍රගතිය 67% ක් වී ඇත. | ව්‍යාපෘතිවල එක් එක් කාර්යයන් සඳහා සැලසුම් වෙන් වෙන්ව සකස් කළ යුතු අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා තාත්වික නිවැරදි ඉලක්ක ඇතුලත් කර එම ඉලක්ක ඉටු කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) | වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය කළමනාකරණය කිරිමේ කාර්යය යටතේ ආසාධිත පොල් පැළ හඳුනාගැනීම හා තෝරාගත් පැළ එන්නත් කිරීම යන කාර්යයන්හි භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 47ක් හා සියයට 60ක් වී තිබුණි. | හම්බන්තොට සහ ගාල්ල ප්‍රාදේශීය කාර්යාල මඟින් ආසාධිත ගස් සලකුණු කරන ලදි. එහෙත් මාතර ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 319 ක් පවතින බැවින් නිලධාරීන් 16 ක් යොදවාගෙන මෙම කාර්ය සිදු කිරීම අපහසු විය. 2023 දෙසැම්බර් මාසය තුළ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ආසාධිත ගස් සලකුණු කිරීම සිදු නොකරන ලද අතර සලකුණු කර ඇති රෝගී ගස් එන්නත් කිරීම් සිදුකරන ලදි.ඒ අනුව | සේවක හිඟය හා කාලය කළමනාකරණය කර ගැනීම තුලින් ඉලක්ක ඉටු කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 2022 වර්ෂයේ එන්නත් කිරීමට නොහැකි ගස් ප්‍රමාණයක්ද 2023 වර්ෂයේ එන්නත් කිරීම සඳහා ඉතිරි විය.එ් අනුව 2023 වර්ෂයේ අවසාන මාස 5 ½ ක පමණ කාලයක් ක්ෂේත්‍ර නිලධාරීන් 20 ක් මඟින් මෙම කාර්යය සිදුකරගෙන යාමේදී සලකුණු කරන ලද ගස් එන්නත් කිරීමේ ඉලක්කය ළඟාකර ගැනීමට නොහැකි වී ඇත. | |

### 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයෙන් බැහැරට ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.36,116 ක ණය ශේෂයක් අවුරුදු 28 කට වැඩි කාලයක සිට අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම නිලධාරියාගේ රු.36,116 ණය ශේෂය කපා හැරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත. | ණය ශේෂය අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතියක් මත ලියා හැරීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | වැඩ තහනම් කර ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් වසර 14 සිට 26 දක්වා කාලයක සිට අයවිය යුතු එකතුව රු.398,511 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. | රු.255,997ක මුදල එම නිලධාරියාට හිමි දේපොළ මඟින් පියවා ගන්නා ලෙස නීතිමය උපදෙස් ලැබී ඇතත් ඉඩමේ අයිතිය පවරා ඇත්තේ අධ්‍යක්ෂ ජනරාල් යන නමට බැවින් එය ලේකම්, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ලෙස වෙනස් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර රු.30,760ක ණය ශේෂය කපාහැරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇත. රු.111,754ක අයවිය යුතු ශේෂය සඳහා අදාළ නිලධාරියාට එරෙහිව නීතිපති මඟින් කටයුතු කරනු ඇත. | ණය ශේෂ අයකර ගැනීමට ගත හැකි සෑම පියවරක්ම ක්‍රියාත්මක කළ යුතු අතර විධිමත් අනුමැතියක් මත අයකර ගත නොහැකි දිගුකාලීන ණය කපා හැරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභ හානි සිදු වී වර්ෂ 01 ත් වර්ෂ 12 ත් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 06 ක් සම්බන්ධයෙන් එකතුව රු. 5,221,961 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට අමාත්‍යාංශයට නොහැකි වී තිබුණි. | සිද්ධීන් 3ක් සම්බන්ධයෙන් නඩු පවරා ඇති අතර ඉතිරි සිද්ධීන් සම්බන්ධයෙන් අලාභය පොතෙන් කපා හැරීමට අනුමැතිය ලැබී ඇත. | පාඩු හා හානි අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අයකර ගත නොහැකි පාඩු හා හානි සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් කර විධිමත් අනුමැතියක් මත කපා හැරිය යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත කාර්යමණ්ඩලය 833ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 772 ක් වූ බැවින් පුරප්පාඩු 61ක් පැවතුණි. | 2022.07.22 දිනෙන් රාජ්‍ය අමාත්‍යාංශ අහෝසි වීමත් සමඟ එම රාජ්‍ය අමාත්‍යාංශවල කාර්ය මණ්ඩලය අදාල කැබිනට් ශයේ කාර්යඅමාත්‍යාංමණ්ඩලය ලෙස සළකා කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් දන්වා ඇති අතර, ඒ අනුව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CM/17 හා 2023.03.31 දිනැති ලිපිය මඟින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර ඇත. ඊට අනුකූලව පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | කාර්ය මණ්ඩල පුරප්පාඩු නිවැරදිව හඳුනාගෙන අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකළ යුතුය. |